# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) - 2016

## තුලනාත්මක අධ්‍යාපනය

### පැය තුනයි (03)

පළමුවන කොටසෙහි සියලුම ප්‍රශ්න වලටද දෙවන කොටසින් අභිමත ප්‍රශ්න තුනකටද පිළිතුරු සපයන්න.

---

## I - කොටස

1. ශ්‍රී ලංකාවේ පැවති පැරණි දේශීය උසස් අධ්‍යාපනය/විශ්වවිද්‍යාලය අධ්‍යාපනය තුළ සෞන්දර්ය අධ්‍යාපනය ලබාදීම සඳහා භාවිත කළ කෘති තුන (03) දක්වන්න.

   (ලකුණු 5)

2. ලන්දේසීන් ලංකාවේ භාවිත කළ පාසල් වර්ග හතරක් (04) ලියා දක්වන්න.

   (ලකුණු 5)

3. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා පාසල්වල සන්ධ්‍යා කාලයේදී ආරම්භකළ වැඩිහිටි පන්තිවල ඉගැන්වූ විෂයන් තුනක් (03) සඳහන් කරන්න.

   (ලකුණු 5)

4. විසිවන සියවස දෙවන භාගය වනවිට අධ්‍යාපනය ආයෝජනයක් ලෙස පිළිගැනීමට මූලික වූ සාධක පහක් දක්වන්න. (ලකුණු 5)

5. 1901 ලංකාවේ ජන සංගනනය තුළින් මතු වූ අධ්‍යාපන ගැටලු දෙකක් සහ ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග තුනක් හඳුන්වන්න. (ලකුණු 5)

6. එංගලන්ත අධ්‍යාපන පද්ධතිය සඳහා 1944 වර්ෂයේ යෝජනා වූ ප්‍රතිසංස්කරණ පහක් දක්වන්න. (ලකුණු 5)

7. ඇමෙරිකාවේ අධ්‍යාපන පද්ධතියෙහි පවතින ගැටලු පහක් ලියා දක්වන්න.

(ලකුනු 5)

8. සංවර්ධනය වෙමින් පවතින රටවල ගුරුවරුන් හා සම්බන්ධව විද්‍යාමානවන ගැටලු තුනක් ලියා දක්වන්න. (ලකුණු 5)

## II - කොටස

9. ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වූ විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳව විමර්ශනය කරන්න.

(ලකුණු 20)

10. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා ඉදිරිපත් කළ අධ්‍යාපන යෝජනා වර්තමානය දක්වාම ශ්‍රී ලංකාව තුළ වෙනස්කම් ඇතිකිරීම කෙරෙහි බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

11. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැදගත්වන්නේ කුමක් නිසාදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 20)

12. i. බ්‍රිතාන්‍ය යුගයේ ෆෙඩ්රික් නෝර්ත් හා රොබට් බ්‍රවුන්රිග් යන ආණ්ඩුකාරවරුන් ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ අනුගමනය කළ ක්‍රියාමාර්ග තුලනාත්මකව ඉදිරිපත් කරන්න.

ii. මෝගන් කමිටුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කර එය ලංකාවේ අධ්‍යාපනයට බලපෑ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 20)

13. i. අධ්‍යාපනයේ ආර්ථික ප්‍රාග්ධනය තක්සේරු කරන සහ සම්බන්ධතා ක්‍රමය හා පරිවැය ප්‍රතිලාභ ක්‍රමය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

ii. අධ්‍යාපනය හා ආර්ථිකය අතර සබඳතාවේදී පැනනගින ගැටලු හඳුන්වා ඒවා විසඳා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග හා නිර්දේශ පෙන්වා දෙන්න.

(ලකුණු 20)

14. i. ඔබ හදාරා ඇති ඕනෑම අධ්‍යාපන පද්ධතියක (ශ්‍රී ලංකාව හැර) සුවිශේෂ ලක්‍ෂණ දක්වා ඒවා විවේචනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 20)

ii. මෙම සුවිශේෂ ලක්‍ෂණ තුළින් ශ්‍රී ලංකාවට ඉගෙනගත හැකි ආදර්ශ/පාඩම් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

15. i. චීන අධ්‍යාපන පද්ධතිය නවීකරණය කළ ආකාරය විග්‍රහකරන්න.

ii. ශ්‍රී ලංකාවට ස්වකීය අධ්‍යාපන පද්ධතිය ප්‍රවර්ධනය සඳහා චීනයෙන් ගත හැකි පාඩම් පැහැදිලි කර දක්වන්න. (ලකුණු 20)

16. i. සංවර්ධිත රටවල උසස් අධ්‍යාපන ක්‍ෂෙත්‍රයෙහි නව ප්‍රවණතා නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

ii. සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපන ක්‍ෂෙත්‍රයේ ඇති ගැටලු ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතිය තුළ කෙතෙක් දුරට විද්‍යාමාන වේදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20)

O∘O∘O∘O∘O∘O∘O∘O∘